---

## කටාන ප්‍රාදේශීය සභාව

## ගම්පහ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කටාන ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කටාන ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉදිකරන ලද / ඉදිකෙරෙමින් පවතින ප්‍රජා ශාලා 05 ක පිරිවැය වෙනුවට අනුමත ඇස්තමේන්තු වටිනාකම ගිණුම්ගත කිරීම හේතුවෙන් එකතුව රු.3,165,772 කින් ස්ථාවර වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභාව විසින් ගෙවන ලද හා අයකරන ලද එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් නිවැරදි ගිණුම් තැබීමකින් තොරව අයකරන ලද බදු ප්‍රමාණය වූ රු.4,194,318 පමණක් ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.53,253,285 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.30,549,660 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000" | රු.000" | රු.000" |
| (i) | වරිපනම් බදු | 29,433 | 22,214 | 30,930 |
| (ii) | බදුකුලී | 1,307 | 947 | 411 |
| (iii) | වෙනත් ආදායම් | 750 | 607 | 199 |

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

අතැති මුදල් හා උප කාර්යාල රැස්කිරිමේ ගිණුම් වල මුදල් විශාල ප්‍රමාණයක් නියමිත පරිදි අරමුදල් ගිණුමට බැර නොකර රඳවා තබා ගැනීම නිසා අරමුදලේ ශේෂය අයිරාවක් බවට පත්ව තිබුණි. අරමුදලේ බැංකු ගිණුම පිළිබඳව වෙනම ගිණුම් පවත්වා නොතිබුණෙන් අයිරාව පොත් වලින් හෙළිදරව් වී නොතිබුණි.

2.4 අරමුදල් ඌන උපයෝජනය

2012 වර්ෂයේදී උදම්මිට ප්‍රජා ශාලාව (නව) ඉදිකිරිම සඳහා අනුමත ප්‍රතිපාදනය වූ රු.3,000,000 ක මුදල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

2.5 කොන්ත්‍රාත් පාලනය

(අ) උදම්මිට ප්‍රජා ශාලාව (නව) ඉදිකිරිම

2008 වර්ෂයේ ඉදිකිරිම් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා දැනට රු.4,274,059 ක් වැය

---

කර තිබුණු නමුත් ඉදිකිරීම් නිමකර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) උදම්මිට ප්‍රජා ශාලාව (පැරණි) ඉදිකිරීම

2008 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා රු.421,291 ක් වැය කර තිබුණු අතර, එහි ඉදිකිරීම් සම්පූර්ණ කර භාවිතයට ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) මල්බෙරිවත්ත ජල යෝජනා ක්‍රමය ඉදිකිරීම

2010 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම් සම්පූර්ණ කර අපේක්ෂිත පරිදි පවුල් 820 කගේ ජල අවශ්‍යතාවය ඉටුකිරීමට කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය